# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය
த. பெ.இ 2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1153/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 13/07/2024 පැය 1525

**මාධ්‍ය නිවේදනය**

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයට අදාල වැඩිදුර වාර්ථාව - කොලොන්න පොලිස් වසම.**

2024.07.09 වන දින රාත්‍රී කාලයේ කොලොන්න පොලිස් වසමේ අප්ටන් වත්ත ප්‍රදේශයේ නිවසක සිටි පුද්ගලයෙකුට යතුරු පැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයන් දෙදෙනෙකු විසින් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීම සම්බන්ධයෙන් කොලොන්න පොලිසිය, පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුර, විශේෂ කාර්යංශ හා යුද හමුදා බුද්ධි අංශ ආදී විමර්ශන කණ්ඩායම් කීපයක් යොදවා වැඩිදුර විමර්ශන කටයුතු සිදු කර ඇත.

එකී විමර්ශනයන්ට අනුව ඝාතනයට අදාල සැකකරුවන් දෙදෙනෙකු පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුරේ නිලධාරීන් විසින් 2024.07.11 වන දින හා අපරාධයට අදාල ගිනි අවිය 2024.07.12 වන දින අත්අඩංගුවට ගෙන කොලොන්න පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 27 හා 48 වයස් වල පසුවන මිද්දෙනිය හා වීරකැටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන්ගෙන් සිදු කරන ලද ප්‍රශ්ණ කිරීම් වලදී අපරාධ රැසකට සම්බන්ධ පුද්ගලයින් බවට කරුණු අනාවරණය වී ඇත. ඒ අනුව ඔවුන් සන්තකයේ තිබී මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක්, එම පතොරම් 02 ක්, ජංගම දුරකථන 02 ක්, යතුරුපැදියක් හා හෙරොයින් ග්‍රෑම් 100 ක් පොලිස් භාරයට ගෙන ඇත.

කොලොන්න පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**